© සියලුම හිමිකම් ඇවිරිණි අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය

## ශිල්පීය අදියර
## 2009 සැප්තැම්බර් විභාගය

විභාග දිනය : 2009 සැප්තැම්බර් 12 පිටු ගණන : 07
විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 ප්‍රශ්න ගණන : 06

අයදුම්කරුවන්ට උපදෙස්:
1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| මූල්‍ය ගිණුම්කරණ මූලිකාංග | (FAF / 501) |

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 16)*

(a) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී අනුගමනය කළ යුතු මූලික ගිණුම්කරණ උපකල්පන තුන සඳහන් කරන්න. (ලකුණු 04)

(b) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ මූලික ගිණුම්කරණ පරමාර්ථය වන්නේ අභ්‍යන්තර හා බාහිර පාවිච්චි කරන්නවුන්ට තොරතුරු සැපයීමයි.

යටත් පිරිසෙයින් එක් ප්‍රධන හේතුවක් හෝ සඳහන් කරමින් ව්‍යාපාර ආයතනයක අභ්‍යන්තර පාවිච්චි කරන්නන් දෙදෙනෙකු (02) හා බාහිර පාවිච්චි කරන්නන් හතර දෙනෙකු (04) සඳහන් කරන්න. (ලකුණු 07)

(c) වංචා හා වැරදි වැළැක්වීමේ අදහසින් පිළියෙල කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රමයක ඉතා වැදගත් ලක්ෂණ 5 ක් දක්වන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 16)

**ප්‍රශ්න අංක 02** *(ලකුණු 18)*

(a) සෑම වසරකදීම අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී දක්ෂතා පෙන්වන තෝරාගත් එක් සිසුවෙකු වෙනුවෙන් ශිෂ්‍යත්වයක් පිරිනැමීම සඳහා 2008.01.01 දින රු. 1,000,000 ක පරිත්‍යාගයක් කොළඹ විශ්ව විද්‍යාලයකට ලැබුණේ ය. මෙම පරිත්‍යාග මුදල ආයෝජනය කර එයින් ලැබෙන ආදායමින් ශිෂ්‍යත්වය මූල්‍යනය කෙරේ.

(i) කොළඹ විශ්ව විද්‍යාලයේ පොත්වල මුදල් ඇතුළුව මෙම ගනුදෙනු සටහන් කිරීමට කෙටි සංලක්ෂ සහිතව ජ'නල් සටහන් පිළියෙල කරන්න. (ලකුණු 05)

(ii) අදාළ ලෙජර් ගිණුම් පිළියෙල කරන්න. (ලකුණු 05)

(b) ප්ලාස්ටික් භාණ්ඩ නිපදවන සීමිත ප්‍රයිම් ප්‍රොඩක්ට්ස් සමාගමේ පහත දැක්වෙන තොරතුරුවලින් 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

| | රු. |
|---|---|
| ආරම්භක තොගය: | |
| අමුද්‍රව්‍ය | 3,200 |
| නොනිමි වැඩ | 1,700 |
| අවසාන තොගය: | |
| අමුද්‍රව්‍ය | 4,600 |
| නොනිමි වැඩ | 2,100 |
| ගෙන ඒමේ කුලී | 400 |
| වැටුප් (wages) | 22,500 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 36,350 |
| කර්මාන්තශාලා කුලී | 8,100 |
| නිෂ්පාදනය සඳහා පුරස්කාරය | 600 |
| මෝස්තර නිර්මාණ පිරිවැය | 780 |
| ආපසු යැවූ අමුද්‍රව්‍ය | 1,100 |
| යන්ත්‍ර හා පිරියත ක්ෂය | 750 |
| ජලය, බලය හා ඉන්ධන | 5,200 |
| කර්මාන්තශාලා පරීක්ෂකගේ වේතන | 9,300 |
| දොරටු පාලකගේ වේතන | 1,400 |
| පිරියත අලුත්වැඩියා කිරීම් | 3,000 |
| ගෙවිය යුතු වැටුප් (wages) | 700 |

(ලකුණු 08)

(මුළු ලකුණු 18)

**<u>ප්‍රශ්න අංක 03</u>** *(ලකුණු 16)*

(a) කේවල ස්වාමි ව්‍යාපාරිකයෙකු වූ පියසේනගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු අදාළ වේ. 2008 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය හා බැංකු සැසඳුම් විස්තරයක් පිළියෙල කරන්න.

(i) 2008.12.31 දින බැංකු ගිණුම් විස්තරය අනුව රු. 75,000 ක බැංකු අයිරාවක් පෙන්වීය.

(ii) ලැබී ඇති එහෙත් බැංකුවට නොයැවූ චෙක්පත්වල වටිනාකම රු. 10,500 කි.

(iii) මුදල් පොතේ පිටු අංක 19 හි දැක්වෙන රු. 1,200 ක බැර ශේෂයක් අඩුවෙන් සටහන් කොට තිබිණ.

(iv) පියසේන වෙනුවෙන් ස්ථාවර නියෝග මත ගෙවන ලද රු. 4,000 ක ජීවිත ආරක්ෂණ වාරිකයක් මුදල් පොතේ සටහන් වී නැත.

(v) දෙසැම්බර් මාසයේ දී රු. 15,800 ක චෙක්පත් බැංකුවේ තැන්පත් කොට ඇත. මේවායින් රු. 5,800 ක චෙක්පත් එකතු කර තිබුණේ 2009 ජනවාරි මාසයේ දී පමණි.

(vi) දෙසැම්බර් මාසය තුළ දී බැංකුවේ තැන්පත් කළ රු. 8,000 ක චෙක්පත් බැංකුව විසින් අගරු කොට දෙසැම්බර් 29 දින ආපසු එවා තිබිණ. එහෙත් මුදල් පොතේ මේ පිළිබඳ කිසිදු සටහනක් තබා නැත.

(vii) කෙලින්ම බැංකුව විසින් එකතු කර ගන්නා ලද රු. 25,000 ක චෙක්පත් සඳහා මුදල් පොතේ සටහන් කොට නැත.

(viii) මුදල් පොතේ සටහන් නොකොට බැංකුවේ තැන්පත් කරන ලද චෙක්පත්වල වටිනාකම රු. 6,500 කි.

(ix) රු. 5,300 කට නිකුත් කරන ලද චෙක්පත් මුදල් පොතේ හරට ලියා තිබිණ.

(x) නිකුත් කරන ලද එහෙත් ගෙවීම සඳහා මාසය තුළ බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත්වල වටිනාකම රු. 30,500 කි.

(ලකුණු 08)

(b) 2008 වර්ෂය සඳහා සෞඛ්‍ය සේවා ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දක්වේ.

| ලැබීම් | රු. | ගෙවීම් | රු. |
|---|---|---|---|
| 2008.01.01 දිනට අත ඉතිරි මුදල් | 7,130 | ක්‍රීඩා භාණ්ඩ මිලට ගැනුම් | 30,590 |
| සාමාජික මුදල් | 47,996 | අර්ධකාලීන මුරකරුගේ හා ක්‍රීඩා භූමි | |
| පරිත්‍යාග | 14,500 | සේවක වැටුප් | 27,500 |
| පුණ්‍යාධාර සංදර්ශන ලැබීම් | 10,450 | ක්‍රීඩා පුහුණුකරුගේ දීමනාව | 9,000 |
| ස්ථාවර තැන්පත් පොලී | 12,000 | උපකරණ මිලට ගැනුම් | 15,000 |
| | | පුණ්‍යාධාර සංදර්ශනයේ වියදම් | 3,750 |
| | | සුළු වියදම් | 2,461 |
| | | 2008.12.31 දිනට අතැති මුදල් | 3,775 |
| | 92,076 | | 92,076 |

පහත දක්වෙන අතිරේක තොරතුරු ක්‍රීඩා සමාජයට අදාළ වේ.

| | | 01/01/2008 රු. | 31/12/2008 රු. |
|---|---|---|---|
| 1) | හිඟ සාමාජික මුදල් | 240 | 280 |
| 2) | ඉදිරියට ලැබූ සාමාජික මුදල් | 64 | 100 |
| 3) | ක්‍රීඩා භාණ්ඩ ඉතිරි තොග | 8,810 | 9,740 |
| 4) | ක්‍රීඩා උපකරණ වටිනාකම | 21,200 | 31,600 |
| 5) | ක්‍රීඩා ගොඩනැගිලි (පිරිවැයෙන් ක්ෂය අඩුකොට) | 40,000 | 38,000 |
| 6) | සැපයුම් ණයහිමියෝ | 10,000 | 10,000 |

**ඔබ විසින් පිළියෙල කළ යුතු දේ:**

(i) 2008.12.31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශය **(ලකුණු 03)**

(ii) 2008.12.31 දිනට ශේෂ පත්‍රය **(ලකුණු 05)**

**(මුළු ලකුණු 16)**

**ප්‍රශ්න අංක 04** *(ලකුණු 13)*

කේවල ස්වාමි ව්‍යාපාරිකයෙකු වූ රංජිත් 2008 වර්ෂය සඳහා ඔහුගේ ගිණුම් පිළියෙල කර දෙන ලෙස ඔබෙන් ඉල්ලයි. පළමු වර්ෂයේ ව්‍යාපාර ගනුදෙනු උපයෝගී පොත්වල විශ්වාසවන්ත ලෙස සටහන් කරන ලද්දේ ආධුනිකයෙකු වූ සෝමදාස විසිනි. ගණිතමය නිරවද්‍යතාවය පිළිබඳව සෝමදාස සහතික වේ. ඒ අනුව පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම සමාන විය. කෙසේ වෙතත් පහත දැක්වෙන ගිණුම්වල යම් යම් වැරදි ඇති බව ඔබට දිස් වේ.

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| තොග | | 10,000 |
| ණයගැතියෝ | 8,000 | |
| විකුණුම් | | 94,000 |
| ගැනුම් | 48,000 | |
| බැංකු අයිරාව | 14,000 | |
| ලලිත්ගෙන් ලබාගත් ණය | 14,000 | |
| ගෙනඒමේ කුලී | 1,000 | |
| ආයෝජන ආදායම් | | 1,000 |
| ආයතන වියදම් | 12,000 | |
| හැරවූ ගැනුම් (ආපසු යැවුම්) | 4,000 | |
| වැටුප් (wages) | 8,000 | |
| මෝටර් වාහන | 30,000 | |
| උපකරණ | | 20,000 |
| හැරවූ විකුණුම් (ආපසු එවුම්) | | 8,000 |
| ගෙනයෑමේ කුලී | | 2,000 |
| ලැබූ වට්ටම් | 1,200 | |
| ලැබූ කොමිස් | 800 | |
| ණයහිමියෝ | | 12,000 |
| විකුණුම් වියදම් | 14,000 | |
| ප්‍රාග්ධනය | 22,000 | |
| අතැති මුදල් | | 2,000 |
| | 163,000 | 163,000 |

මෝටර් වාහන වසර 3 ක් ඇතුළත ක්ෂය කපාහැරීමට රංජිත් බලාපොරොත්තු වන අතර උපකරණ වසරකට 10% බැගින් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමට අපේක්ෂා කරයි. අවසාන ඉතිරි තොගවල අගය රු. 3,000 කි.

**ඔබ විසින්:**

(a) ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි 04 ක් දැක්විය යුතුයි. **(ලකුණු 04)**

(b) ගිණුම්කරණ අව්‍යතාවය සඳහා ඉහත ශේෂ පිරික්සුම වැරදි බැවින්, නිවැරදි ශේෂ පිරික්සුමක් පිළියෙල කළ යුතුයි. **(ලකුණු 03)**

(c) 2008 වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුමක් පිළියෙල කළ යුතුයි. **(ලකුණු 06)**

**(මුළු ලකුණු 13)**

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 15)</u>*

ලාභාලාභ 3 : 2 යන අනුපාතයට බෙදා ගැනීමට P සහ Q හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළේ ය.

සමස්ත පරිපාලන කටයුතු වෙනුවෙන් P ට මාසිකව රු. 5,000 ක වේතනයක් හිමි වේ.

ප්‍රාග්ධනයට පොලී වසරකට 6% කි. ජංගම ගිණුම් සඳහා වසරකට පොලී 8% කි.

හවුල්කරුවන්ගෙන් ගත් ණය සඳහා වසරකට පොලිය 10% ක් වන අතර ගැනිලි සඳහා අය කෙරෙන පොලිය වසරකට 10% කි.

P සහ Q පිළිවෙලින් රු. 100,000/- හා රු. 60,000/- ක් ප්‍රාග්ධනය වශයෙන් යොදා ඇත.

දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ ජංගම ගිණුම්වල ශේෂ:

- P ජංගම ගිණුම් ශේෂය රු. 7,000 බැර
- Q ජංගම ගිණුම් ශේෂය රු. 3,000 බැර

ඔවුන්ගේ ගැනිලි: දෙසැම්බර් 31 දිනට

- P - රු. 4,000
- Q - රු. 3,000

2008 වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය රු. 38,000 ක ශුද්ධ ලාභයක් ලබා ඇත.

ඉහත තොරතුරු සැළකිල්ලට ගෙන

(a) පිළියෙල කරන්න (i) 2008 වර්ෂය සඳහා ලාභාලාභ විසර්ජන ගිණුම **(ලකුණු 06)**

(ii) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් **(ලකුණු 06)**

(b) 2008.12.31 දිනට ශේෂ පත්‍රයේ හවුල්කරුවන්ගේ අයිතිය දක්වෙන ආකාරය පෙන්වන්න. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 06** *(ලකුණු 22)*

2008 දෙසැම්බර් 31 දිනට සීමිත ඇප්ටෙක් ඇඟලුම් සමාගමේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර<br>රු.'000 | බැර<br>රු.'000 |
|---|---|---|
| <u>නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවා නිමි ප්‍රාග්ධනය</u> | | |
| 10% රු. 10 වරණීය කොටස් | | 500 |
| රු. 10 සාමාන්‍ය කොටස් | | 1,500 |
| පොදු සංචිතය | | 100 |
| ලාභාලාභ ගිණුමේ ශේෂය | | 230 |
| 10% ණයකර | | 50 |
| අත්පිට විකුණුම් | | 1,500 |
| ණයට විකුණුම් | | 2,500 |
| 2008.01.01 දිනට තොග | 400 | |
| ගැනුම් | 2,800 | |
| කීර්තිනාමය | 50 | |
| සින්නක්කර ඉඩම් පිරිවැයට | 500 | |
| ලී බඩු හා සවිකිරීම් පිරිවැයට | 40 | |
| මෝටර් වාහන පිරිවැයට | 200 | |
| යන්ත්‍ර සහ උපකරණ පිරිවැයට | 300 | |
| ආයෝජන - ස්ථාවර තැන්පත් | 600 | |
| ක්ෂය වෙන්කිරීම: | | |
| ගොඩනැගිලි | 60 | |
| යන්ත්‍ර හා උපකරණ | 50 | |
| ලී බඩු හා සවිකිරීම් | 35 | |
| බැංකු ණය | 50 | |
| බොල්ණය සඳහා වෙන්කිරීම | | 30 |
| වැටුප් හා වේතන | 340 | |
| සේ.අ.අ. (EPF) හා සේ.භා.අ. (ETF) | 48 | |
| විදුලිය | 32 | |
| සන්නිවේදන වියදම් | 50 | |
| වෙනත් පරිපාලන වියදම් | 100 | |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 220 | |
| ගෙනයෑමේ වියදම් | 60 | |
| බැංකු ගාස්තු | 20 | |
| නීතිඥ ගාස්තු | 120 | |
| වෙළඳ ණයහිමියෝ | | 975 |
| වෙළඳ ණයගැතියෝ | 1,300 | |
| ණය පොලී | 35 | |
| ගෙන ඒමේ වියදම් | 200 | |
| පෙර ගෙවුම් | 205 | |
| ස්ථාවර තැන්පත් පොලී | | 60 |
| බැංකු අයිරාව | | 40 |
| අතැති මුදල් | 60 | |
| | 7,680 | 7,680 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

1) 2008.12.31 දිනට තොග රු. 600,000 කට අගය කොට ඇත.

2) වෙනත් පරිපාලන වියදම්වල ඉදිරියට ගෙවූ රු. 15,000 ක රක්‍ෂණ වාරිකයක් අඩංගු වේ.

3) විකුණුම් වියදම් තුළ ප්‍රචාරණ ගිවිසුමක් වෙනුවෙන් ඉදිරියට ගෙවූ රු. 25,000 ක මුදලක් ඇතුළත් වේ.

4) සින්නක්කර ඉඩම්වල ඇතුළත් ගොඩනැගිලි පිරිවැය රු. 320,000 කි.

5) මෝටර් වාහන මේ වසර තුළ ලබාගෙන ඇති බැවින් 20% බැගින් ක්‍ෂය කරනු නොලැබේ.

6) ක්‍ෂය වෙන් කළ යුතුයි:

| | |
|---|---|
| - ගොඩනැගිලි පිරිවැය මත වසරකට | 5% |
| - යන්ත්‍ර හා උපකරණ වසරකට | 10% |
| - ලී බඩු හා සවිකිරීම් වසරකට | 12 ½% |

7) 2008 වසර සඳහා නොගෙවූ උපචිත විදුලිය රු. 15,000 සහ වැටුප් හා වේතන රු. 35,000 කි.

8) ලාභයෙන් රු. 50,000 පොදු සංචිතයට මාරු කිරීමටත්, වරණීය කොටස් ලාභාංශ ගෙවීමටත්, සාමාන්‍ය කොටස් සඳහා 10% ක ලාභාංශයක් ගෙවීමටත් අධ්‍යක්‍ෂවරු තීරණය කරති.

**අභ්‍යන්තර ආයෝජනය සඳහා සුදුසු පරිදි ඔබ විසින් පහත සඳහන් දේ පිළියෙල කළ යුතුයි:**

(i) 2008.12.31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ වෙළඳ හා ලාභාලාභ ගිණුම **(ලකුණු 08)**

(ii) ලාභාලාභ විසර්ජන ගිණුම **(ලකුණු 04)**

(iii) 2008.12.31 දිනට ශේෂ පත්‍රය **(ලකුණු 10)**

**(මුළු ලකුණු 22)**

***ප්‍රශ්න පත්‍රය අවසානයි***